# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1697/27 - 2011 මාර්තු 18 වැනි සිකුරාදා - 2011.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී.6/2001.

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26 වැනි වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදනු ලබන රීති.

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2011 ක් වූ මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

රීති

1. 2004 මැයි මස 17 වැනි දින අංක 1341/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2004 ණය ගෙවීමේ හැකියාවේ සීමා (සාමාන්‍ය රක්ෂණ) රීති පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 4 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"4. (1) ණය ගෙවීමේ හැකියාවේ සීමා නිශ්චය කිරීමේ කාර්යය සඳහා, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ පහත දැක්වෙන වත්කම් ප්‍රභේද සහ පහත නිශ්චිතව දක්වා ඇති සමස්ථ ආවේශ්‍ය වත්කම් ප්‍රමාණ හෝ ප්‍රතිශත (මෙම රීතිවල "ආවේශ්‍ය වත්කම්" ලෙස සඳහන් කරනු ලබන) ආවේශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය :-

| | | | | |
|---|---|---|---|---|
| (අ) | (i) | ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද හෝ සම්පූර්ණයෙන්ම සහතික කරන ලද ණය සුරැකුම් | - | 100% |
| | (ii) | යම් විදේශ රටක යම් ආණ්ඩුවක් හෝ මහ බැංකුවක් විසින් නිකුත් කරන ලද හෝ සහතික කරන ලද ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන ණය සුරැකුම් | - | 20% |
| (ආ) | | ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද සමාගමක සාමාන්‍ය කොටස් | - | 30% |

(ඇ) (i) බහුපාර්ශ්වික නියෝජිත ආයතනයක් විසින් නිකුත් කරන ලද යම් ඇපයක් හෝ ආයෝජන මට්ටම් අනුපාතිකයක් ඇති යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් නිකුත් කරනු ලබන ඇපයක් මගින් සනාථ කරන ලද හෝ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් නිකුත් කරන ලද ආයෝජන මට්ටම් අනුපාතිකයක් ඇති බැඳුම්කර, ඍණපත්‍ර, වාණිජපත්‍ර සහ වෙනත් සමාන මූල්‍ය සාධනපත්‍ර ද ඇතුළු සාංගමික ණය - 60%

(ii) ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති බැඳුම්කර, ඍණපත්‍ර වාණිජපත්‍ර සහ වෙනත් සමාන මූල්‍ය සාධනපත්‍ර ඇතුළු සාංගමික ණය - 10%

(iii) සමාගමක් විසින් නිකුත් කරනු ලබන ආයෝජන මට්ටම් අනුපාතිකයක් ඇති බැඳුම්කර, ඍණපත්‍ර, වාණිජපත්‍ර සහ වෙනත් සමාන මූල්‍ය සාධනපත්‍රද ඇතුළු සාංගමික ණය - 10%

(iv) අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධනය සහ පොළිය හෝ කල් පිරීමේ වටිනාකම, ආයෝජන මට්ටමේ අනුපාතිකයක් දරනු ලබන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් මගින් සහතික කරන ලද වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත් - 10%

(v) බදු අයිතිය දරන ඉඩම් සහ ගොඩනැගිලි : - 15%

එසේ වූව ද, ඉහත (i), (ii), (iii), (iv), සහ (v), උපඡේදවල සඳහන් ආයෝජන සම්බන්ධයෙන් ආවේශ්‍ය කරගනු ලබන ප්‍රතිශතවල එකතුව මුලු ආවේශ්‍ය සමාහාර වත්කම්වලින් සියයට හැටක් නොඉක්මවිය යුතු යඃ

එසේම, ඉහත (v) වැනි උපඡේදයේ සඳහන් ආයෝජන මෙම රීති ක්‍රියාත්මක වන දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා පමණක් ආවේශ්‍යවන ලෙස සළකනු ලැබිය යුතු ය. තව ද එකී ආයෝජනය 2010, දෙසැම්බර් මස 31 වැනි දින හෝ ඊට පෙර කර තිබිය යුතුය : සහ

එසේම, තවදුරටත් ණය නිකුත් කිරීම සහ සනාථ කිරීම එකම බැංකුවකින් නොකල යුතුය (බැංකුවක් ණය නිකුත් කරන අවස්ථාවක)

(ඈ) (i) ආයෝජන මට්ටම් අනුපාතිකයක් පවත්වාගෙන යනු ලබන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ඇති තැන්පතු මුදල් - 40%

(ii) ආයෝජන මට්ටම් අනුපාතිකයක් පවත්වාගෙන යනු ලබන යම් බලපත්‍රලාභී මූල්‍ය සමාගමක ඇති තැන්පතු මුදල් - 10%

එසේ වුව ද,

(අ) මෙම උපඡේදය යටතේ ණය ගෙවීමේ හැකියාව නිශ්චය කිරීමේ කාර්ය සඳහා ආවේශ්‍ය කරගනු ලබන වත්කම් ප්‍රතිශතවල එකතුව එකී ආවේශ්‍ය කරගත හැකි වත්කම්වලින් සියයට හතලිහක් නොඉක්මවිය යුතු ය;

(ආ) තැන්පතු මුදල්, පොළිය දරන තැන්පතු මුදල් විය යුතු ය; සහ

(ඇ) ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන යම් බලපත්‍රලාභී මූල්‍ය සමාගමක ඇති යම් තැන්පතු මුදල්, එම බලපත්‍රලාභී මූල්‍ය සමාගම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිශ්චය කරනු ලබන දිනයක ලැයිස්තුගත වී ඇත්නම් පමණක් ආවේශ්‍ය කරගනු ලැබිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| (ඖ) | රක්ෂිතයා විසින් පදිංචිව සිටින, නිදහස් අයිතිය දරන ඉඩම් සහ ගොඩනැගිලි | - | 10% |
| (ඍ) | ආයෝජන කාර්ය සඳහා දරනු ලබන නිදහස් අයිතිය දරන ඉඩම් සහ ගොඩනැගිලි | - | 10% |
| (ඌ) | ඒකකභාර/අනෝන්‍ය අරමුදල් | - | 25% |
| (ඌෟ) | බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මගින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් මගින් ආරක්ෂක භාරයෙහි තබා ඇති රත්රන් | - | 20% හෝ රක්ෂණකරු මත පනවනු ලැබිය හැකි යම් ආයෝජන සම්බාධක මත පදනම් විය හැකි මණ්ඩලයේ අනුමතය සහිත 20% ට වැඩි ප්‍රතිශතයක්. මෙම අනුමතය, රක්ෂණකරු මත පනවනු ලැබිය හැකි යම් ආයෝජන සම්බාධක මත පදනම් විය හැකිය. |
| (එ) | සියලු ආශ්‍රිත සමාගම්වල කරන ලද ආයෝජන (ආයෝජන, ඉහත නිශ්චිතව දක්වා ඇති සීමා කිරීම් ප්‍රකාරව කරනු ලැබිය යුතු ය.) | | ආයෝජන මට්ටමේ අනුපාතිකයක් පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හැර 5% ක් වන උපරිම තනි ඉදිරිපත් කිරීමකට යටත්වන 7.5% ක්. |
| (ඒ) | යම් පවරන ලද සමාගමක් විසින් ප්‍රතිරක්ෂකයාට ලැබිය යුතු ගෙවීම් හිලව් කිරීමෙන් පසු ප්‍රතිරක්ෂකයාගෙන් එම පවරන ලද සමාගමට මාස හයකට නොවැඩි කාලයක් සඳහා ලැබිය යුතු ශුද්ධ මුදල් ප්‍රමාණය | | සැබෑ මුදල |
| (ඔ) | රක්ෂණ ඔප්පුව ආරම්භ කිරීමේ දින සිට දින හැටකට නොවැඩි කාලයක් සඳහා රක්ෂණ ඔප්පු හිමියාගෙන් අයවිය යුතු රක්ෂණ වාරික මුදල් | | සැබෑ මුදල |
| (ඕ) | ණය ප්‍රදානය කිරීම සඳහා 2010 දෙසැම්බර් මස 31 වැනි දින වන විට මණ්ඩලයේ පූර්ව ලිඛිත අනුමතය ලැබී ඇති යම් නිශ්චල දේපලක් මත වූ ගෙවීමට ඇති හිඟ උකස් ණය | - | 20% |

(2) 2001 මාර්තු මස 01 වැනි දිනයේ දී හෝ ඉන්පසු (1) වැනි ඡේදයෙහි සඳහන් වත්කම් ශ්‍රී ලංකාවෙන් බැහැරව තබා ඇති අවස්ථාවක දී, එම වත්කම් ශ්‍රී ලංකාවෙන් බැහැරව තැබීම සඳහා අවසර දෙනු ලබමින් පනතේ 25 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ මණ්ඩලයේ අවසරය ලබාගෙන ඇති අවස්ථාවක දී පමණක්, එම ඡේදයේ සඳහන් එම වත්කම් සහ ප්‍රමාණයන් හෝ ප්‍රතිශතයන් ණය ගෙවීමේ හැකියාව නිශ්චය කිරීම සඳහා ආවේශ්‍ය කරගනු ලැබිය හැකි ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වැනි උපඡේදයේ දක්වා ඇති යම් ප්‍රමාණ හෝ ප්‍රතිශතවලට අනුව වූ එම ඡේදයේ දක්වා ඇති වත්කම්, එම වත්කම් බැඳීම්වලින් නිදහස් නම් පමණක්, ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීම සඳහා ආවේශ්‍ය කරගත හැකි වත්කම් ලෙස සැලකිය යුතු ය. තව ද, එම බැඳීම් සහිත වත්කම් වලින් උපචිත වන්නා වූ අනුරූපී වගකීම් ණය ගෙවීමේ සීමාව නිශ්චය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු ය.

(2) එහි 5 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"5 (1) 4 වැනි රීතියෙහි නිශ්චිතව සඳහන් කොට ඇති ආවේශ්‍ය කළ හැකි වත්කම්වල අගය ණය ගෙවීමේ හැකියාවේ සීමාවේ කාර්ය සඳහා පහත සඳහන් ආකාරයට නිශ්චය කරනු ලැබිය යුතු ය :-

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද සතියේ ආර්ථික දර්ශකවල නිරූපණය කරනු ලබන රජයේ සුරැකුම්පත්වල ආසන්නතම දෛනික සාමාන්‍ය විකුණුම් මිල විය යුතු ය.

(ii) ඇපකරු විසින් සහතික කර නිකුත් කරන ලද සහ විදේශ රජය හෝ පිළිවෙළින් සඳහන් රජයෙහි මහ බැංකුව විසින් නිකුත් කරන ලද ආසන්නතම ප්‍රසිද්ධ ගැණුම් මිල විය යුතු ය.

(ආ) පිරිවැය හෝ වෙළඳපල වටිනාකම යන දෙකෙන් වඩා අඩු වටිනාකම මත තක්සේරුකරනු ලැබිය යුතු ය.

| | |
|---|---|
| (ඇ) (i), (ii), (iii), — සහ (iv) | ලැයිස්තුගත සාංගමික ණය යන්න සඳහා -<br><br>කොළඹ කොටස් හුවමාරුවෙහි දී තීරණය කරන ලද අවසාන වෙළඳාම්කළ කොටස්වලට අනුව පවත්නා වෙළඳපළ මිල විය යුතු ය.<br><br>ලැයිස්තුගත නොකළ සාංගමික ණය යන්න සඳහා -<br><br>සරල රේඛීය ගණන් බැලීමේ ක්‍රමය හෝ නියත පළදා ක්‍රමය යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් භාවිත කරමින් කල්පිරීමේ දිනයට ක්‍රමානුකූල පදනමක් මත වෙන් කරන ලද වාරික ක්‍රමක්ෂය කිරීම සඳහා හෝ වට්ටම් උපචයනය කිරීම සඳහා ගලපන ලද පරිදි ගත් පිරිවැය අගය විය යුතු ය. (පිරිවැය + උපචිත වූ ආදායම) |
| (ඇ) (v) බදු අයිතිය— දරනු ලබන ඉඩමේ වටිනාකම | මණ්ඩලය විසින් අනුමත කරනු ලබන තක්සේරුකරුවකු විසින් නිශ්චය කරනු ලබන පිරිවැය අගය හෝ ප්‍රති ප්‍රමාණකළ වටිනාකම විය යුතු ය. |
| (ඇ) (v) බදුඅයිතිය— දරනු ලබන ගොඩනැගිල්ලේ වටිනාකම | සමුචිත ක්ෂයවීම් අඩුකිරිමෙන් පසු පිරිවැය වටිනාකම හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් කරන ලද යම් ප්‍රතිප්‍රමාණය කිරීමකින් පසු සමුචිත ක්ෂය වීම් වටිනාකම අඩුකිරීමෙන් පසුව එම ප්‍රතිප්‍රමානකළ වටිනාකම විය යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ) (i) සහ (ii) | - | තැන්පතුවල මූලික වටිනාකම සහ උපචිත වූ පොළිය විය යුතු ය. |
| නිදහස් අයිතිය දරන ඉඩමේ වටිනාකම | - | මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් නිශ්චය කරනු ලබන පිරිවැය වටිනාකමකට හෝ ප්‍රතිප්‍රමාණකරන ලද යම් අගයක් විය යුතු ය. |
| නිදහස් අයිතිය දරන ගොඩනැගිල්ලේ අයිතිය | - | සමුචිත ක්ෂයවීම් අඩුකිරීමෙන් පසු පිරිවැය වටිනාකම හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් කරන ලද යම් ප්‍රතිප්‍රමාණය කිරීමකින් පසු සමුචිත ක්ෂය වීම් වටිනාකම අඩුකිරීමෙන් පසුව එම ප්‍රතිප්‍රමාණ කළ වටිනාකම විය යුතු ය. |
| (උ) | - | පිරිවැය වටිනාකම හෝ කළමණාකරුවන්ගේ මිලදී ගැනීමේ මිල යන දෙකෙන් අඩු මුදල සඳහා තක්සේරු කළ යුතු ය. |
| (ඌ) | - | පිරිවැය හෝ වෙළඳපල වටිනාකම යන දෙකෙන් අඩු මුදල සඳහා තක්සේරු කළ යුතු ය. |

(2) මාස හයකට වඩා වැඩි කාලයක් හිඟ මුදලක් වශයෙන් අය විය යුතු වන්නා වූ ආයෝජන ආදායමක් අවිනිශ්චිත ණය මුදලක් ලෙස රක්ෂණකරුවකු විසින් සලකනු ලැබිය යුතු අතර, එකී ආදායම මත උපචය වන වත්කම්, ණය ගෙවීමේ හැකියාවේ සීමාව තීරණය කරනු ලැබීමේ දී බැහැර කරනු ලැබිය යුතු ය.".

(3) එහි 5 වැනි රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන රීතිය ඇතුළත් කිරීමෙන් :-

"5 අ. 4(1) (අ)(ii), (ඇ)(i), (iii), (iv), (ඈ)(i) සහ (ii) රීතියෙහි නිශ්චිතව දක්වා ඇති යම් වත්කමක් :-

(අ) යම් වත්කමක් ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් අස්තිත්‍වයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම වත්කම හෝ අස්තිත්‍වය, ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ උපලේඛනයේ I වැනි කොටසේ නිශ්චිතව දක්වා ඇති අවම ජාත්‍යන්තර අව්‍යශතා හෝ කලින් කලට නිකුත් කරන අවම ජාත්‍යන්තර අනුප්‍රමාණ සපුරාලන්නේ නම් පමණක් ආවේශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය; සහ

(ආ) යම් වත්කමක් ශ්‍රී ලංකාව තුළ දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කර ඇති යම් අස්තිත්‍වයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම වත්කම හෝ අස්තිත්‍ව, ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනයක් විසින් අනුප්‍රමාණකර ඇත්නම් සහ උපලේඛනයේ II වැනි කොටසේ නිශ්චිතව දක්වා ඇති අවම අවශ්‍යතා හෝ කලින් කලට නිකුත් කරන අවම අනුප්‍රමාණ සපුරාලන්නේ නම් පමණක් ආවේශ්‍ය වත්කමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) එහි 6 වැනි රීතිය ඉවත් කිරීමෙන් ; සහ

(5) 8 වැනි රීතිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :-

" 8. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම රීතිවල -

"පනත" යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත අදහස් වේ;

"වත්කම් මගින් සනාථ කරන ලද සුරැකුම්පත්" යන්නෙන් ස්ථාවර හෝ වෙනස්වන ස්වකීය නියමයක් මගින් නිශ්චිත කාලයක් ඇතුලත මුදල් බවට හැරවිය හැකි ලැබීම්වල භින්නවූ සංචිතයක් හෝ මූල්‍ය ගැලීම් සහ සුරැකුම්පත් දරන්නන්ට සේවා සැපයීම හෝ ප්‍රතිලාභ නියමිත වේලාවට බෙදාහැරීම තහවුරු කරනු ලබන යම් අයිතීන් හෝ වෙනත් නම්කල වත්කම් මගින් මූලික වශයෙන් සේවා සපයන ලද යම් සුරැකුම්පත් අදහස් වේ;

"මණ්ඩලය" යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අදහස් වේ;

"සමාගම" යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් අදහස් වේ;

"ආයෝජන මට්ටම් අනුප්‍රමාණය" යන්නෙන් මෙම රීතිවල උපලේඛනයේ, අවස්ථාවෝචිත පරිදි, (I) වැනි සහ (II) වැනි කොටස්වල නිශ්චිතව දක්වා ඇති යම් ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනයක් විසින් පවරාදෙන ලද සහ පූර්ව මාස දහ අටක කාලය ඇතුළත පවරාදෙනු ලැබූ හෝ සමාලෝචනය කරන ලද යම් අනුප්‍රමාණයක් වූ ණය අනුප්‍රමාණයක් අදහස් වේ ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ වාණිජ බැංකුවක් වශයෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් සමාගමක් හෝ ආයතනයක් අදහස් වේ ;

"බලපත්‍රලාභී මුල්‍ය සමාගම" යන්නෙන් 1988 අංක 78 දරන මුල්‍ය සමාගම් පනත යටතේ මුල්‍ය සමාගමක් වශයෙන් ලියාපදිංචිකර ඇති යම් සමාගමක් අදහස් වේ ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් වශයෙන් බලපත්‍රයක් නිකුත් කර ඇති යම් සමාගමක් හෝ ආයතනයක් අදහස් වේ ;

"බහුපාර්ශ්වික නියෝජිත ආයතනය" යන්නෙන් මෙම රීතිවල කාර්ය සඳහා බහුපාර්ශ්වික නියෝජිත ආයතනයක් වශයෙන් මණ්ඩලය විසින්, කලින් කළ, තීරණය කරනු ලැබිය හැකි සහ අනුමත කරනු ලැබිය හැකි ආයතනයක් හෝ ජාත්‍යන්තර මුල්‍ය සහයෝගිතා ආයතනය අදහස් වේ ;

"ආශ්‍රිත සමාගම" යන්නනට 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල "ආශ්‍රිත පාර්ශවය" යන්නට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් වශයෙන් යම් බලපත්‍රයක් නිකුත් කර ඇති සංස්ථාපිත ආයතනයක් අදහස් වේ ; සහ

"ඒකක භාරය" යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව සහ එම පනත යටතේ කළමණාකරණ සමාගම වෙත බලපත්‍රයක් ප්‍රදානය කර ඇති යම් ඒකක භාරයක් අදහස් වන අතර, මණ්ඩලය විසින් අවසර දී ඇති ආයෝජනයක් වන ශ්‍රී ලංකාවෙන් පිටත යම් ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ද ඊට ඇතුළත් වේ.".

(6) 8 වැනි රීතියට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන් :-

උපලේඛනය

(5 අ රීතිය)

I වැනි කොටස

| *ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනය* | *අස්තිත්‍යයේ හෝ සුරැකුමෙහි අවම ජාත්‍යන්තර අනුප්‍රමාණය* | *සුරැකුමෙහි කෙටිකාලීන (අවුරුද්දකට අඩු) අවම ජාත්‍යන්තර අනුප්‍රමාණය* |
|---|---|---|
| (1) මූඩි'ස් ඉන්වෙස්ටර් සර්විසස් | බීඒඒ 3 | පී 3 |
| (2) ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්'ස් කෝපරේෂන් | බීබීබී - | ඒ 3 |
| (3) ෆිච් රේටින්ස් | බීබීබී - | එෆ් 3 |
| (4) ඒ. එම්. බෙස්ට් කම්පැනි ඉන්කෝපරේෂන් | බීබීබී - | ඒඑම්බී - 3 |

II වැනි කොටස

| *ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනය* | *අස්තිත්‍යයේ හෝ සුරැකුමෙහි අවම අනුප්‍රමාණය* | *සුරැකුමෙහි කෙටිකාලීන (එක් අවුරුද්දකට අඩු) අවම අනුප්‍රමාණය* |
|---|---|---|
| (1) ෆිච් රේටින්ස් (ලංකා) ලිමිටඩ් | බීබීබී -(අයිකේ ඒ) | එෆ් 3 (අයිකේ ඒ) |
| (2) රැම් රේටින්ස් (ලංකා) ලිමිටඩ් | බීබීබී - | පී 3 |

(7) මෙකී රීති වර්ෂ 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට බලාත්මක වේ.

04-180/1

එල්.ඩී.බී.6/2001.

**2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත**

2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 26 වැනි වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 105 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් සාදන ලද රීති.

සභාපති,
ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය.

2011 ක් වූ මාර්තු මස 17 වැනි දින,
කොළඹ දී ය.

රීති

2002 සැප්තැම්බර් මස 24 වැනි දින අංක 1255/12 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2002 ණය ගෙවීමේ හැකියාවේ සීමා (දීර්ඝ කාලීන රක්ෂණ) රීති, පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 2 වැනි රීතියේ (2) වැනි උපරීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපරීතිය ඇතුළත් කිරීමෙන් :-

"(3) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරය පවත්වාගෙන යන සහ සම්බන්ධිත දීර්ඝ කාලීන රක්ෂණ නිෂ්පාදන නිකුත් කරන සෑම රක්ෂණකරුවකු විසින් —

(i) ඒකක නොවන ගිණුමකින් පැන නගින වගකීම් සම්බන්ධයෙන් ; සහ

(ii) ඉතිරි කිරීම් ප්‍රතිලාභ රක්ෂණකරු විසින් සහතික කරනු ලබන අවස්ථාවක ඒකක ගිණුමකින් පැන නගින වගකීම් සම්බන්ධයෙන්,

මෙම රීතිවලට අනුකූලව ක්‍රියා කළ යුතු ය.";

(2) එහි 13 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"13. (1) ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ පහත දැක්වෙන වත්කම් ප්‍රභේද සහ නිශ්චිත වශයෙන් පහත දක්වා ඇති (සමස්ථ ආවේශ්‍ය වත්කම්) යම් ප්‍රමාණ හෝ ප්‍රතිශත (මෙම රීතිවල "ආවේශ්‍ය වත්කම්" ලෙස සඳහන් කරනු ලබන) ආවේශ්‍ය ලෙස සලකනු ලැබිය යුතු ය.

| | | | | |
|---|---|---|---|---|
| (අ) | (i) | ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද හෝ සම්පූර්ණයෙන්ම සහතික කර ඇති ණය සුරැකුම්පත් | - | 100% |
| | (ii) | යම් විදේශ රටක යම් ආණ්ඩුවක් හෝ මහ බැංකුවක් විසින් නිකුත් කරන ලද හෝ සම්පූර්ණයෙන්ම සහතික කර ඇති සාධන පත්‍රයට ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන ණය සුරැකුම්පත්. | - | 20% |
| (ආ) | | ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කරන ලද සමාගමක සාමාන්‍ය කොටස් | - | 40% |
| (ඇ) | (i) | බහුපාර්ශ්වික නියෝජිත ආයතනයක් විසින් නිකුත් කරන ලද යම් ඇපයක් හෝ ආයෝජන මට්ටම් අනුපාතිකයක් ඇති යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් නිකුත් කරනු ලබන ඇපයක් මගින් සනාථ කරන ලද හෝ යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් නිකුත් කරන ලද ආයෝජන මට්ටම් අනුපාතිකයක් ඇති බැඳුම්කර, සෘණපත්‍ර, වාණිජපත්‍ර සහ වෙනත් සමාන මූල්‍ය සාධනපත්‍ර ද ඇතුළු සාංගමික ණය | - | 50% |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) | ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත කර ඇති බැඳුම්කර, සෘණපත්‍ර, වාණිජපත්‍ර සහ වෙනත් යම් සමාන මූල්‍ය සාධනපත්‍ර ඇතුළු සාංගමික ණය | — | 10% |
| | (iii) | සමාගමක් විසින් නිකුත් කරනු ලබන ආයෝජන මට්ටම් අනුපාතිකයක් ඇති බැඳුම්කර, සෘණපත්‍ර, වාණිජපත්‍ර සහ යම් වෙනත් සමාන මූල්‍ය සාධනපත්‍රද ඇතුළු සාංගමික ණය | — | 10% |
| | (iv) | අවස්ථාවෝචිත පරිදි, ප්‍රාග්ධනය සහ පොළිය නැතහොත් කල් පිරීමේ අගය ආයෝජන මට්ටමේ අනුපාතිකයක් දරනු ලබන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් විසින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් විසින් සහතික කරන ලද වත්කම් මගින් සනාථ කරනු ලබන සුරැකුම්පත් | — | 10% |
| | (v) | බදු අයිතිය දරන ඉඩම් සහ ගොඩනැගිලි | — | 15% |

එසේ වුව ද, ඉහත සඳහන් (i), (ii), (iii), (iv) සහ (v) යන උපඡේදවල සඳහන් ආයෝජන සම්බන්ධයෙන් ආවේශ්‍ය කරන ලද ප්‍රතිශතවල මුළු එකතුව ආවේශ්‍ය කළ හැකි වත්කම්වල මුළු සමස්ථය සියයට පනහක් නොඉක්මවිය යුතු ය ;

එසේම, ඉහත (v) යන උපඡේදයේ සඳහන් ආයෝජන මෙම රීති ක්‍රියාත්මක වන දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා පමණක් ආවේශ්‍යවන ලෙස සළකනු ලැබිය යුතු ය. තව ද එකී ආයෝජනය 2010 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙර කර තිබිය යුතුය ; සහ

එසේම තවදුරටත්, ණය නිකුත් කිරීම සහ සනාථ කිරීම එකම බැංකුවකින් නොකළ යුතුය (බැංකුවක් ණය නිකුත් කරන අවස්ථාවක).

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | (i) | ආයෝජන මට්ටම් අනුපාතිකයක් පවත්වාගෙන යනු ලබන යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක ඇති තැන්පතු මුදල් | — | 40% |
| | (ii) | ආයෝජන මට්ටම් අනුපාතිකයක් පවත්වාගෙන යනු ලබන යම් බලපත්‍රලාභී මූල්‍ය සමාගමක ඇති තැන්පතු මුදල් | — | 10% |

එසේ වුව ද,

(අ) මෙම උපඡේදය යටතේ ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා ආවේශ්‍ය කරගනු ලබන වත්කම් ප්‍රතිශතවල මුළු එකතුව, එකී ආවේශ්‍ය කල හැකි වත්කම්වලින් සියයට හතලිහක් නොඉක්මවිය යුතු ය;

(ආ) තැන්පතු මුදල, පොළියක් දරන තැන්පතු මුදල් විය යුතු ය; සහ

(ඇ) ආයෝජන මට්ටම් අනුපාතිකයක් දරනු ලබන යම් බලපත්‍රලාභී මූල්‍ය සමාගමක ඇති තැන්පතු මුදල්, එකී බලපත්‍රලාභී මුල්‍ය සමාගම ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිශ්චය කරනු ලබන දිනයක ලැයිස්තුගත වී ඇත්නම් පමණක් ආවේශ්‍ය කරනු ලැබිය යුතු ය.

| | | | |
|---|---|---|---|
| (ඉ) | රක්ෂණකරු පදිංචිව සිටින, නිදහස් අයිතිය දරන ඉඩම් සහ ගොඩනැගිලි | — | 15% |
| (ඊ) | ආයෝජන කාර්ය සඳහා දරනු ලබන නිදහස් අයිතිය දරන ඉඩම් සහ ගොඩනැගිලි | — | 15% |
| (උ) | ඒකක භාර/අන්‍යොන්‍ය අරමුදල් | — | 25% |

| | | |
|---|---|---|
| (ඌ) | බලපත්‍රලාභී වාණිජ බැංකුවක් මගින් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් මගින් ආරක්ෂක භාරයෙහි තබා ඇති රත්රන් | - 20% හෝ රක්ෂණකරු මත පනවනු ලැබිය හැකි යම් ආයෝජන සම්බාධක මත පදනම් විය හැකි මණ්ඩලයේ අනුමතය සහිත 20% ට වැඩි ප්‍රතිශතයක්. මෙම අනුමතය, රක්ෂණකරු මත පනවනු ලැබිය හැකි යම් ආයෝජන සම්බාධක මත පදනම් විය හැකිය. |
| (එ) | සියලු ආශ්‍රිත සමාගම්වල කරන ලද ආයෝජන (ආයෝජන, ඉහත නිශ්චිතව දක්වා ඇති සීමා කිරීම් ප්‍රකාරව කරනු ලැබිය යුතු ය). | ආයෝජන මට්ටමේ අනුපාතිකයක් පවත්වාගෙන යනු ලබන බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හැර 5% ක් වන උපරිම තනි ඉදිරිපත් කිරීමකට යටත්වන 7.5%. |
| (ඒ) | යම් පවරන ලද සමාගමක් විසින් ප්‍රතිරක්ෂකයාට ලැබිය යුතු ගෙවීම් හිලව් කිරීමෙන් පසු ප්‍රතිරක්ෂකයාගෙන් එම පවරන ලද සමාගමට මාස හයකට නොවැඩි කාලයක් සඳහා ලැබිය යුතු ශුද්ධ මුදල් ප්‍රමාණය. | සැබෑ මුදල |
| (ඔ) | රක්ෂණ ඔප්පුවේ භාරදීමේ අගය ඇතුළත ණය මුදලක් ලබා දී ඇති අවස්ථාවක, හිඟ ඔප්පු ණය මුදල් ප්‍රමාණය. | සැබෑ මුදල |

(2) 2001 මාර්තු මස 01 වැනි දින හෝ එදිනට පසුව, (1) වැනි ඡේදයෙහි සඳහන් වත්කම් ශ්‍රී ලංකාවෙන් බැහැරව තබා ඇති අවස්ථාවක දී, එම වත්කම් ශ්‍රී ලංකාවෙන් බැහැරව තබා ගැනීමට අවසර ලබා දෙමින් පනතේ 25 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ මණ්ඩලයේ අවසරය ලබාගෙන ඇති අවස්ථාවක දී පමණක්, එම ඡේදයේ සඳහන් එම වත්කම්වල ප්‍රමාණය හෝ ප්‍රතිශතය ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීම සඳහා ආවේශ්‍ය කරගනු ලැබිය හැකි ලෙස සලකනු ලැබිය යුතු ය.

2 - G 14287

(3) (1) වැනි උපරීතියේ සඳහන් යම් ප්‍රමාණ හෝ ප්‍රතිශතවලට අනුව වූ එම ඡේදයේ දක්වා ඇති වත්කම්, එම වත්කම් බැඳීම්වලින් නිදහස් නම් පමණක්, ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීම සඳහා ආවේශ්‍ය කරගත හැකි වත්කම් ලෙස සැලකිය යුතු ය. තව ද, එම බැඳීම් සහිත වත්කම්වලින් උපචිත වන්නා වූ අනුරූපී වගකීම් ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු ය." ;

(3) එම රීතිවල 14 වැනි රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"14. (1) 13 වැනි රීතියේ නිශ්චිතව දැක්වෙන ආවේශ්‍ය වත්කම්වල අගය ණය ගෙවීමේ හැකියාවේ සීමාවේ කාර්ය සඳහා පහත දැක්වෙන ආකාරයට නිශ්චය කරනු ලැබිය යුතු ය.

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කරන ලද සතියේ ආර්ථික දර්ශකවල සඳහන් ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආසන්නතම දෛනික සාමාන්‍ය විකුණුම් මිල විය යුතු ය.

(ii) ඇපකරු විසින් සහතික කර නිකුත් කරනු ලැබුවා වූ ද විදේශීය ආණ්ඩුවක් හෝ පිළිවෙළින් සඳහන් ආණ්ඩුවෙහි මහ බැංකුව විසින් නිකුත් කරනු ලැබුවා වූ ද, පළ කරන ලද ආසන්නතම ගැණුම් මිල විය යුතු ය.

(ආ) පිරිවැය හෝ වෙළඳපල අගය තක්සේරු කළ යුතු අතර එම වටිනාකම් දෙකෙන් වඩා අඩු වටිනාකම විය යුතු ය.

| | |
|---|---|
| (ඇ) (i), (ii), (iii) සහ (iv) | ලැයිස්තුගත සාංගමික ණය යන්න සඳහා -<br><br>කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවෙහිදී නිශ්චය කරන ලද අවසන්වරට වෙළඳාම්කළ ව්‍යාපාර වස්තු ප්‍රකාරව පවත්නා වෙළඳපළ මිල විය යුතු ය.<br><br>ලැයිස්තුගත නොකළ සාංගමික ණය යන්න සඳහා -<br><br>සරල රේඛීය ගණන් බැලීමේ ක්‍රමය හෝ නියත පළදා ක්‍රමය යන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් භාවිත කරමින් කල්පිරීමේ දිනය දක්වා ක්‍රමානුකූල පදනමක් මත වෙන් කරන ලද වාරික ක්‍රමක්ෂය කිරීම සඳහා හෝ වට්ටම් උපචයනය කිරීම සඳහා ගලපන ලද පරිදි ගත් පිරිවැය අගය විය යුතු ය. (පිරිවැය + උපචිත වූ ආදායම) |
| (ඇ) (v) බදු අයිතිය දරන ඉඩමක අගය | මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් නිශ්චය කරන ලද පිරිවැය අගය හෝ ප්‍රති ප්‍රමාණකළ වටිනාකම විය යුතු ය. |
| (ඇ) (v) බදු අයිතිය දරන ගොඩනැගිල්ලක අගය | සමුචිත ක්ෂයවීම් අඩුකිරීමෙන් පසු පිරිවැය අගය හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් කරන ලද යම් ප්‍රතිප්‍රමාණය කිරීමකින් පසු සමුචිත ක්ෂය වීම් මුදල අඩුකිරීමෙන් පසුව එම ප්‍රතිප්‍රමාණකළ මුදල විය යුතු ය. |
| (ඈ) (i) සහ (ii) | තැන්පතුවේ මූලික අගය සහ උපචිත වූ පොලිය විය යුතු ය. |
| නිදහස් අයිතිය දරන ඉඩමේ අගය | මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් නිශ්චය කරනු ලබන පිරිවැය අගය හෝ ප්‍රතිප්‍රමාණකරන ලද මුදල විය යුතු ය. |

| | |
|---|---|
| නිදහස් අයිතිය දරන ගොඩනැගිල්ලේ අගය | සමුචිත ක්ෂය වූ මුදල අඩුකොට ලැබෙන පිරිවැය අගය හෝ මණ්ඩලය විසින් අනුමත කරන ලද තක්සේරුකරුවකු විසින් කරන ලද යම් ප්‍රතිප්‍රමාණය කිරීමකින් පසු සමුචිත ක්ෂය වීම් වටිනාකම අඩුකිරීමෙන් පසුව එම ප්‍රතිප්‍රමාණය කළ වටිනාකම විය යුතු ය. |
| (උ) | පිරිවැය අගය හෝ කළමණාකරු මිලදී ගත් මිල යන දෙකෙන් වඩා අඩු මුදල සඳහා තක්සේරු කළ යුතු ය. |
| (ඌ) | පිරිවැය අගය හෝ වෙළඳපල අගය යන දෙකෙන් වඩා අඩු මුදල සඳහා තක්සේරු කළ යුතු ය. |
| (ඔ) | ගෙවා නොමැති ප්‍රාග්ධනය හෝ ලබාගත හැකි ණය මුදලේ ශුද්ධ අගය යන දෙකෙන් වඩා අඩු ප්‍රමාණය නොඉක්ම විය යුතු ය. |

(2) මාස 6 කට වැඩි කාලයක් හිඟව ඇති ආයෝජන ආදායමක් රක්ෂණකරුවකු විසින් අවිනිශ්චිත ණයක් ලෙස සැලකිය යුතු අතර ණය ගෙවීමේ හැකියාවේ සීමාව නිශ්චය කිරීමේ දී එම ආදායම මත උපචය වන වත්කම් බැහැර කරනු ලැබිය යුතු ය.";

(4) එම රීතිවල 14 වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් :-

"14අ. 13(1) (අ)(ii), (ඇ)(i), (iii), (iv), (ඈ)(i) සහ (ii) යන රීතිවල නිශ්චිතව දැක්වෙන යම් වත්කමක් :-

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත දී නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද යම් අස්තිත්‍යයක් විසින් නිකුත් කර ඇති අවස්ථාවක දී, එම වත්කම් ආවේශ්‍ය කළ හැකි ලෙස සලකනු ලැබිය යුත්තේ, අවස්ථාවෝචිත පරිදි, එම වත්කම හෝ අස්තීත්වය ණය අනුප්‍රමාණ ගත කිරීමේ නියෝජිත ආයතනයක් විසින් අනුප්‍රමාණ කර ඇත්නම් සහ උපලේඛනයේ I වන කොටසේ නිශ්චිතව දැක්වෙන අවම ජාත්‍යන්තර අවශ්‍යතා හෝ කලින් කලට නිකුත් කරන අවම ජාත්‍යන්තර අනුප්‍රමාණ සපුරාලන්නේ නම් පමණි ; සහ

(ආ) ශ්‍රී ලංකාව තුළ නිකුත් කර ඇති අවස්ථාවක දී හෝ ශ්‍රී ලංකාවේ සංස්ථාගත කරන ලද යම් අස්තීත්වයක් විසින් නිකුත් කරනු ලැබුවහොත්, එම වත්කම ආවේශ්‍ය කළ හැකි වත්කමක් ලෙස සලකනු ලැබිය යුත්තේ, අවස්ථාවෝචිත පරිදි, එම වත්කම් හෝ අස්තීත්වය ණය අනුප්‍රමාණගත කිරීමේ නියෝජිත ආයතනයක් විසින් අනුප්‍රමාණ කර ඇතිනම් සහ උපලේඛනයේ II වන කොටසේ නිශ්චිතව දැක්වෙන අවම අවශ්‍යතා හෝ කලින් කලට නිකුත් කරන අවම අනුප්‍රමාණ සපුරාලන්නේ නම් පමණි.

(5) 17 රීතිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

" 17. මෙම රීතිවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"පනත" යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත අදහස් වේ;

"ජීව ගණක" යන්නෙන් මේ පනත යටතේ පිළිගනු ලබන ජීව ගණකවරයකු අදහස් වේ;

"වත්කම් වලින් සනාථ කරන ලද සුරැකුම්පත්" යන්නෙන් ස්ථාවර හෝ වෙනස්වන ස්වකීය නියමයක් මගින් නිශ්චිත කාලයක් ඇතුළත මුදල් බවට හැරවිය හැකි ලැබීම්වල හින්නවූ සංචිතයක් හෝ මූල්‍ය ගැලීම් සහ සුරැකුම්පත් දරන්නන්ට සේවා සැපයීම හෝ ප්‍රතිලාභ නියමිත වේලාවට බෙදාහැරීම තහවුරු කරනු ලබන යම් අයිතීන් හෝ වෙනත් නම්කළ වත්කම් මගින් මූලික වශයෙන් සේවා සපයන ලද යම් සුරැකුම්පත් අදහස් වේ;

"මණ්ඩලය" යන්නෙන් 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය අදහස් වේ;

"සමාගම" යන්නෙන් 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සමාගමක් අදහස් වේ;

"ආයෝජන මට්ටම් අනුප්‍රමාණය" යන්නෙන් මෙම රීතිවල උපලේඛනයේ, අවස්ථාවෝචිත පරිදි, (I) වැනි සහ (II) වැනි කොටස්වල නිශ්චිතව සඳහන් ණය අනුප්‍රමාණ ගතකිරීමේ නියෝජිත ආයතනයක් විසින් පවරාදෙන ලද සහ පූර්ව මාස දහඅට ඇතුළත පවරාදෙනු ලැබූ හෝ සමාලෝචනය කරන ලද යම් අනුප්‍රමාණයක් වූ ණය අනුප්‍රමාණයක් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ වාණිජ බැංකුවක් වශයෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් සමාගමක් හෝ යම් ආයතනයක් අදහස් වේ;

"බලපත්‍රලාභී මූල්‍ය සමාගම" යන්නෙන් 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ මූල්‍ය සමාගමක් වශයෙන් ලියාපදිංචිකර ඇති සමාගමක් අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනත යටතේ විශේෂිත බැංකුවක් වශයෙන් බලපත්‍රයක් නිකුත්කර ඇති සමාගමක් හෝ යම් ආයතනයක් අදහස් වේ;

"බහුපාර්ශ්වික නියෝජිත ආයතනය" යන්නෙන් මෙම රීතිවල කාර්ය සඳහා බහුපාර්ශ්වික නියෝජිත ආයතනයක් වශයෙන් මණ්ඩලය විසින්, කලින් කළ, තීරණය කරනු ලැබිය හැකි සහ අනුමත කරනු ලැබිය හැකි ආයතනයක් හෝ ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා ආයතනය අදහස් වේ;

"ආශ්‍රිත සමාගම" යන්නට 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත යටතේ පිහටුවන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවල "ආශ්‍රිත පාර්ශවය" යන්නට ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය ;

"ව්‍යාපාර වස්තු විනිමය ස්ථානය" යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත යටතේ ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස බලපත්‍රයක් නිකුත්කර ඇති සංස්ථාපිත ආයතනයක් අදහස් වේ;

"ඒකක භාරය" යන්නෙන් 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනතේ අර්ථානුකූලව සහ එම පනත යටතේ කළමනාකරණ සමාගම වෙත බලපත්‍රයක් ප්‍රදානයකර ඇති යම් ඒකක භාරයක් අදහස් වන අතර, මණ්ඩලය විසින් අවසර දී ඇති ආයෝජනයක් වන ශ්‍රී ලංකාවෙන් පිටත යම් ඒකක භාරයක් හෝ අන්‍යෝන්‍ය අරමුදලක් ඊට ඇතුළත් වේ."

(6) 17 වැනි රීතියට ඉක්බිතවම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :-

උපලේඛනය

(14 අ රීතිය)

I වැනි කොටස

| ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනය | අස්ථිත්‍යයේ හෝ සුරැකුම්පතේ අවම ජාත්‍යන්තර අනුප්‍රමාණය | සුරැකුම්පතේ කෙටිකාලීන (වර්ෂයකට වඩා අඩු) අවම ජාත්‍යන්තර අනුප්‍රමාණය |
|---|---|---|
| (1) මූඩිස් ඉන්වෙස්ටර් සර්විසස් | බීඒඒ 3 | පී 3 |
| (2) ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් කෝපරේෂන් | බීබීබී - | ඒ 3 |
| (3) ෆිච් රේටින්ස් | බීබීබී - | එෆ් 3 |
| (4) ඒ. එම්. බෙස්ට් කම්පැණි ඉන්කෝපරේෂන් | බීබීබී - | ඒඑම්බී - 3 |

II වැනි කොටස

| ණය අනුප්‍රමාණ නියෝජිත ආයතනය | අස්ථිත්‍යයේ හෝ සුරැකුම්පතේ අවම අනුප්‍රමාණය | සුරැකුම්පතේ කෙටිකාලීන (වර්ෂයකට වඩා අඩු) අවම අනුප්‍රමාණය |
|---|---|---|
| (1) ෆිච් රේටින්ස් (ලංකා) ලිමිටඩ් | බීබීබී -(එල්කේ ඒ) | එෆ් 3 (එල්කේ ඒ) |
| (2) රැම් රේටින්ස් (ලංකා) ලිමිටඩ් | බීබීබී - | පී - 3 |

(7) මෙම රීති වර්ෂ 2011 අප්‍රේල් මස 01 වැනි දින සිට බලාත්මක වේ.

04-180/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.